4

10 ශ්‍රේණිය සිංහල
භාෂාව හා සාහිත්‍යය

Hasitha Hettiarachchi
071-9020298

# පිළිතුරු

# ආරාමයේ නිර්මාණය

**අවබෝධය**

1. සශ්‍රීක නගර හා සරුසාර ගම් අසල ආරාම ඉදි වීමට තුඩු දුන් හේතුව කුමක් ද?
2. "සිද්ධීන් දෙක ම වූයේ දේවානම්පියතිස්ස සමයේ දී ය" මේ ප්‍රකාශයේ දැක්වෙන සිදුවීම් දෙක සඳහන් කරන්න.
3. සිවු දිගින් පැමිණෙන භික්ෂූන් සඳහා කරවන ලද විහාරයකට අත්‍යවශ්‍ය අංග තුන නම් කරන්න.
4. පැන් මඩිය, පාදෙණිය යන නම්වලින් හඳුන්වනු ලබන ආරාම අංග දෙකෙහි කාර්යභාරය දක්වන්න.
5. බෝ ගසක අත්තක් කැපීමට අවසර ලැබුණේ කවර අවස්ථාවන්හි ද?

(01) ගිහි පැවිදි ආශ්‍රය පහසුවෙන් නොකඩවා පවත්වා ගත හැකි වන පරිදි සශ්‍රීක නගර හා සරුසාර ගම් අසල ආරාම පහළ වන්නට විය.

(02) (i) ථූපාරාමය කරවීම.
(ii) ශ්‍රී මහා බෝධි ශාඛාව මහාමේඝනා උයනේ රෝපණය කිරීම.

(03)
(i) චෛත්‍යයක්
(ii) ලැගුම්ගෙය.
(iii) ධර්ම දේශනා කිරීමට ස්ථානයක්.

(04) පැන් මඩිය - පැන් කළ තබා තිබීම.
පාදෙණිය - වන්දනා කරුවන්ට පා සෝදා ගැනීමට දිය පිරවූ ගල්දෙණිය.

(05) * ප්‍රතිමාවකට හෝ ආසනාඝරයකට හෝ බාධාවක් වූ විට.
* ප දිරනා හෝ දුම්මලකාරී ආදිය වැඩෙනා හෝ අත්තක් කැපීම.

**ලිඛිත අභ්‍යාස**

1. පහත දැක්වෙන වචන සඳහා යෙදෙන සිංහල වචන පාඩමෙන් උපුටා ලියන්න.

| | |
|---|---|
| i. වාලුකාංගණ | v. පුප්ඵාධාන |
| ii. බෝධිඝර | vi. චේතියඝර |
| iii. හත්ථිපාකාර | vii. අජාතශත්‍රු |
| iv. පටිමාඝර | viii. ශ්වේත ඡත්‍රය |

(01) (i) වාලුකාංගණ - වැලි මළුව.
(ii) බෝධිඝර - බෝගෙය.
(iii) හත්ථිපාකාර - ඇත් පවුර
(iv) පටිමාඝර - පිළිමගෙය.
(v) ~~ව~~ පුප්ඵාධාන. - මේදිකාපුටි.
(vi) චේතිඝර - සෑගෙය.
(vii) පාද පීඨිකා - අඩි සලකුණු
(vii) අජාතශත්‍රු - අජාසත් රජු
(viii) ශ්වේත ඡත්‍රය - සුදු කුඩ,

2. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන වචනය තෝරන්න.

i. මිදුල - මළුව, මාලකය, අංගණය, <u>එළිමහන</u>
ii. ගෘහය - <u>මාළිගාව</u>, ගෙය, ඝරය, නිවාසය
iii. ස්තූපය - චෛත්‍යය, <u>ආරාමය</u>, දාගැබ, සෑය
iv. ප්‍රාකාරය - පවුර, <u>පරික්ෂේපය</u>, කොටුව, තාප්පය
v. කන්ද - ගිර, <u>උච්චය</u>, පව්ව, පර්වතය

3. පහත දැක්වෙන පද සඳහා විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | විවේකී | ii. | සාමාන්‍යයෙන් |
| iii. | ආගන්තුක | iv. | සශ්‍රීක |
| v. | ආශ්‍රය | vi. | ඇතුළත |
| vii. | පැළදිග | viii. | ජනශූන්‍ය |

(03) (i) අවිවේකී .
(ii) අසාමාන්‍යයෙන්
(iii) නේවාසික .
(iv) ~~නිසරු~~ . නිශ්‍රීක
(v) නිආශ්‍රය නිරාශ්‍රය
(vi) පිටත ,
(vii) අපරදිග .
(viii) ජනාදික , ජනාධික

# සාම්ප්‍රදායික යෙදුම්

**ලිඛිත අභ්‍යාස**

1. පහත දැක්වෙන රූඪීවලින් පළ වන අර්ථය ඉදිරියෙන් ලියන්න.

i. ඇගේ ලේ වතුර වුණා - දැඩි ලෙස බිය වීම.
ii. ඉබාගාතෙ යනවා - අරමුණකින් තොරව යාම.
iii. අබ මල් රේණුවක් වත් - කිසිම ආකාරයකින් විශ්වාස කළ නොහැකි.
iv. අංගේ ඉඳන් කන කනවා - කෙනෙකුන් සමීපයේ සිට ඔහුට එරෙහිව වැඩ කිරීම.
v. එක පතේ කෑ - ඉතා සුහදව ආශ්‍රය කළ.
vi. ඉහ නිකට බලා - තරාතිරම, තත්වය, වයස ආදිය සිතා කටයුතු කිරීම.
vii. මුළු සේසත ම - සියලු වත්කම්.
viii. දිවෙන් දිව ගා ගෙන - දැඩි මිත්‍රත්වයක් පවත්වා ගනිමින්.
ix. අං ඇවිල්ලා - මහත් සේ අහංකාරව කටයුතු කිරීම.
x. දඩමීමා කර ගත් - යමක් හෝ යමෙකු මුල් කරගෙන ඉන් වාසි ලැබීමට කටයුතු කිරීම.

2. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවලින් පළ වන අර්ථය ලියන්න.

i. නරියාට කුකුල් කොටුව බාර දුන්නා වගේ
ii. කබලෙන් ළිපට වැටුණා වගේ
iii. උණහපුළුවට උගේ පැටියා මැණිකලු
iv. දියකාවගෙ පිටේ ලුණු හැංගුවා වගේ
v. ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ

01. විශ්වාසය තැබිය නොහැකි කෙනෙකුට කිසියම් වැඩක් භාර දීම.
02. තිබුණාටත් වඩා අසීරු තත්වයකට පත්වීම.
03. කාට වුවත් තමන් සතු දේ අගේ ඇති බව.
04. කිසිම ආරක්ෂාවක් නොමැති ලෙස යමක් කිරීම.
05. විපතක් වූ කෙනෙකුට තවත් විපතක් සිදු වීම.

3. පහත දී ඇති ප්‍රස්තාව පිරුළු යොදා වාක්‍ය තනන්න.

i. ආඬි හත් දෙනාගෙ කැඳ හැළිය වගේ
ii. හිසරදේට කොට්ටෙ මාරු කරන්නා සේ
iii. වැල යන අතට මැස්ස ගහන්නා සේ
iv. එළ හරකයි මී හරකයි එකට ඇඳුවා වගේ
v. බැඳගත්ත බෙරේ ගහන්න ඕනෑ

01. විනෝද චාරිකාවක් යාමට මුදල් එක් රැස් කිරීමට ඔවුන් කතිකා කර ගත්තත් එය අවසානයේ ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ විය.
02. හිසරදේට කොට්ටෙ මාරු කරන්නා සේ ඔහු වරින් වර තම සේවා ස්ථානය මාරු කළේය.
03. වැල යන අතට මැස්ස ගහන්නා සේ ඔහු තම ප්‍රතිපත්ති කාලානුරූපීයව වෙනස් කළේය.
04. පියදාසත් සිරිසේනත් එකතු වී කුඹුර අස්වැද්දීමට යනු දුටු ගම්හු, එළ හරකයි මී හරකයි එකට ඇඳුවා වගේ යැයි කීහ.
05. බිරියගේ ඇනුම් පද ඇසූ හෙතෙම දැන් ඉතින් බැඳගත්ත බෙරේ ගහන්න ඕනෑ යැයි තම මිතුරාට පැවසුවේය.

4. පහත දැක්වෙන යුගල පද සම්පූර්ණ කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | තෑගි | බෝග................. | vi. | තුටු | පහටු................. |
| ii. | අවි | ආයුධ................. | vii. | අරුම | පුදුම................. |
| iii. | උදවු | පදවු................. | viii. | ගනු | දෙනු................. |
| iv. | ඉඳුම් | හිටුම්................. | ix. | ඉහින් | කනින්................. |
| v. | ලේසි | පහසු................. | x. | ගමේ | ගොඩේ................. |